

# එක්ව හෙට දින යහ සිතින්
# *together for tomorrow*
நாளைக்காக இணையும் நல்லுள்ளங்கள்

**good hands**
*together for tomorrow*

goodhands.lk



good hands

එක්ව හෙට දින යහ සිතින්

## දැක්ම

- ශ්‍රී ලංකාවේ පරිභෝජන අවශ්‍යතාවයන් ඉටු කිරීම.
- ශ්‍රී ලංකාවට අත්‍යවශ්‍ය වන්නා වූ විදේශ විනිමය ලබා ගැනීම.
- ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් අවම වී යන්නා වූ පොල් පලදාව නැවත නගා සිටු වීම.

## මෙහෙවර

- සෑම ශ්‍රී ලාංකිකයෙකුම, සුදුසු ස්ථානයක අළුතින් එක් පොල් පැලයක් හෝ රෝපණය කිරීම සඳහා උනන්දු කරවීම සහ රෝපණය කිරීමට පොල් ගෙඩියක් මගින් පොල් පැල ලබා ගැනීමේ ක්‍රම සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
- පොල් පැල රෝපණය කිරීම සඳහා අවශ්‍යය තාක්ෂණික උපදෙස් සහ සහාය ලබා දීම.
- අදාළ රාජ්‍ය දෙපාර්තමේන්තු, පොල් නිෂ්පාදකයින් සහ ක්ෂේත්‍රයේ ප්‍රාමාණිකයින් සම්බන්ධ කර ගෙන පොල් වගාව දිරිමත්කිරීම සඳහා සාර්ථක අඩිතාලමක් ඇති කරලීම.

# good hands සංකල්පය

**කප් රැක** සහ **සුරතුර** නමින් හැඳින්වෙන පොල්ගස ශ්‍රී ලංකාව සහ එහි ආහාර සංස්කෘතිය සමග පරම්පරා ගණනාවක බැඳීමක් ඇත්තකි. පෙරදින මෙම කප් රැක දිවයින පුරා පැතිර පැවැති නමුදු, නූතනයේ පෙර හා සමානවම රෝපණය කරනු දක්නට නොලැබේ.

මෑත අතීතයේ දී, ශ්‍රී ලංකාවේ නිර්යාත ආදායමට පිළිවෙලින් උර දී තිබුණේ, තේ, රබර් සහ පොල්ය. **නිර්යාත භෝගයක්** ලෙසින් මනාව ස්ථාපිතව තිබුණද, පොල්, සම්මතයක් ලෙසින් ආහාර පිසීමේදී අත්‍යවශ්‍ය සංයෝජනයක් ද විය. මෑතක් වන තුරු කප් රැක්, පාර දෙපැත්තේත්, ගෙවුයන් තුළත්, ගම්බද මෙන්ම නගරබද පොදු ස්ථානයන්හිත් දිවයින පුරා දක්නට ලැබිණි. මෙලෙසින්ම බොහෝ ශ්‍රී ලාංකිකයින් තම ගෙවත්තෙන් ලබා ගන්නා පොල් පලදාවෙන් තම දෛනික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට පුරුදුව සිටියේය.

ජනාවාසී පෙදෙස් වලින් ක්‍රමිකව පොල්ගස් අතුරුදහන් වීම පසු ගිය දශක කිහිපය පුරාවටම ඉතාමත් කැපී පෙනෙන ලෙසින් දිස් විය. නාගරීකරණය නිසාවෙන් ඇති වූ ශීඝ්‍ර ඉල්ලුමත් සමගම පොල්වතු කුඩා කට්ටි වලට කැඩීම බහු විධ සමාගම් මෙන්ම විවිධ පුද්ගලයින් විසින්ද වාණිජමය පරමාර්ථ පෙරදැරිව සිදුවීම ඇරඹිණි.

ඉතාමත් කෙටි කලකින් මෙරට පරිභෝජනය සඳහා මෙන්ම නිර්යාතයන් සඳහා ද ඉල්ලුම සැපයීමට පොල්පලදාවට නොහැකි විය. ඊළඟ දශකයෙදී ත් මෙම පලදා ඌණතාවය පැවතුණහොත්, ඉතාමත් දරුණු නිෂේධාත්මක බලපෑමක් පොල් කර්මාන්තයේ සෑම අංශයකටමත්, පොල් මිල වැඩිවීමටත් ඇති කරන බැව් අනිවාර්ය කරුණක් වන්නේය. මෙම තීරණාත්මක අවස්ථාවේ දී ක්ෂණිකව ක්‍රියාත්මක වුවහොත්, පවතින ව්‍යසනකාරී තත්ත්වයෙන් මිදීම අසීරු නොවන්නේය. සාධනීය ක්‍රියාකාරී සැළැස්ම වන්නේ ප්‍රශ්නයේ මූලය හඳුනා ගෙන, එයට නිසි පිළියම් යෙදීමයි: මෙම මූලය වන්නේ අවශ්‍යතාවයේ පමණට පොල්ගස් නොමැති වීමයි.



ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල පොල් පරිභෝජනය ඉහළ අගයක් ගෙන ඇත්තේ අපගේ සාම්ප්‍රදායික ආහාරවේල වැඩි මනත් පොල් මත පදනම්ව තිබීම නිසාවෙනි. දැනට ඇස්තමේන්තු කර ඇති අන්දමට, පොල් බිලියන 1.8 ක්, එනම් වාර්ෂික පලදාවෙන් **සියයට 70** ක් පමණ භාවිතා වන්නේ ගෘහාශ්‍රිත ආහාර සඳහා වෙනුවෙනි. එමෙන්ම නූතන අධ්‍යයනයන්ගෙන් පෙනී යන්නේ එක් පොල්ගසකින් ලැබෙන්නා වූ පලදාව එක් පුද්ගලයෙකුගේ වාර්ෂික පරිභෝජනය සඳහා සෑහෙන බවයි.

**good hands සංකල්පය** මගින් හඳුන්වා දෙනු ලබන්නේ අවම වශයෙන් එක් රටවැසියෙකු එක් පොල් ගසක් රෝපණය කර එය නඩත්තු කිරීමේ අගනා අදහසයි. මෙනයින් වාර්ෂිකව අවම වශයෙන් බිලියන 1.8 ක පොල් පලදාවක් ලබා ගත හැකි වෙනු ඇත. මෙමගින් නිවසේ ආහාර වියදම අඩු කර ගත හැකිවනවා පමණක් නොව නිවසේ පිසෙන ආහාරයන්ගේ සුරක්ෂිත බව සහ සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා වීමද නිතැතින්ම සිදු වේ. මෙය ජාතික ආහාර සුරක්ෂිත භාවය කෙරෙහිද බලපෑමක් ඇති කරනු නිසැකය. එමතුදු නොව, මෙම අළුතින් එකතු වන්නා වූ බිලියන 1.8 පලදාව නිසාවෙන් නූතනයේ පරිභෝජනය කෙරෙන්නා වූ බිලියන 1.8 ඉතිරි වන්නේය. මෙම ප්‍රමාණය පොල් යොදා කෙරෙන විවිධ කර්මාන්ත සඳහා භාවිතා කර අපනයන කිරීමෙන් රටට අද අත්‍යවශ්‍යව තිබෙන්නා වූ විදේශ විනිමයද ලබා ගැනීමට හැකි වන්නේය. මෙම අතිරේකව ලැබෙන්නා වූ විදේශ විනිමය රටෙහි ඉක්මන් ආර්ථික සංවර්ධනයට උපස්ථම්භක වෙනවා නොඅනුමානය.



# good hands ඉදිරි ගමන

සුදුසු ස්ථානයක එක් අයෙකු අවම වශයෙන් එක් පොල් පැළෑටියක් රෝපණය කිරීමෙන් මෙය ඇරඹිය හැකිය. මෙමගින් ශ්‍රී ලංකාවේ ජනගහණයට සමතුලිතවන ප්‍රමාණයක පොල් ගස් සමූහයක් වර්ධනය කර ගැනීමේ විභවය පවතියි. එහි අවසන් ප්‍රතිපලය වන්නේ රට තුළ ගෘහීය පරිභෝජනයට අවශ්‍ය වන්නා වූ පොල් පලදාවෙන් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත වීමයි.

තමන්ම වවා ලබා ගන්නා වූ පොල් පලදාව පිරිවැය අවම වීම නිසාවෙන් ලැබෙන්නා වූ ප්‍රතිලාභ ඉමහත්ය. එමෙන්ම ගෘහස්ථ ආහාර සුරක්ෂිතභාවයද ඉහළ අගයක් ගනු ඇත. මේ සියල්ලම රටෙහි ආහාර සුරක්ෂිත භාවයටද ඉමහත් බල පෑමක් ඇති කරන්නේය.

එමතුදු නොව අළුතින් රෝපණය කිරීමෙන් පසු ලබා ගන්නා සෑම පොල් ගෙඩියක්ම දැනට සිටවා පල දරන්නා වූ පොල් ගෙඩියක් සඳහා වන්නා වූ ආදේශකයකි. එම ලබා ගන්නා පොල් අපනයන සඳහා කෙරෙන නිපැයුම් වෙනුවෙන් භාවිතා කිරීමෙන් රටට අත්‍යවශ්‍ය විදේශ විනිමය සම්භාරයක් සොයා ගත හැකි වන්නේය. අද සිදු කරන ඉතාමත් ම පහසු සාධනීය **good hands** ක්‍රියාවක් හෙට දින මුළු මහත් ජාතියම වර්ධනය කරන්නෙහිය!



# good hands
# ප්‍රජා සත්කාරය

සුදුසු තැනෙක, එක් පැලයක් හෝ රෝපණය කිරීම සඳහා සෑම ශ්‍රී ලාංකිකයෙකුටම අවශ්‍ය වන්නා වූ තොරතුරු සහ පිටුබලය බීජ / බීජාංකුර ලබා ගැනීමේ ක්‍රියා දාමයේ සිට ඵලදාව ලබා ගන්නා අවස්ථාව දක්වා සෑම අදියරයකදී ම ලබා දීමට බලාපොරොත්තු වේ.

එමෙන්ම මෙම ජාතික කර්තව්‍යයේ උන්නතිය සඳහා ප්‍රයෝජනවත් වන්නා වූ යෝජනා සහ උපදෙස් ජන සමාජයෙන් ද, පොල් කර්මාන්තයේ නියුතු ප්‍රාමාණිකයින්ගෙන් ද, පොල් වවන්නා වූ ප්‍රජාවගෙන් ද, රාජ්‍ය බලධාරීන්ගෙන් ද අනෙකුත් සියළුම අදාළ පාර්ශ්වයන්ගෙන් ද, අවසාන අරමුණ ඉෂ්ඨ කර ගැනීම සඳහා ලබා ගැනීම ද සිදු කෙරෙන්නෙහිය.


# ඔබ දන්නෙහිද?
# ඔබ දැන සිටියාද?



- පොල් ගසක් පල දරන්නේ සාමාන්‍යයෙන් අවුරුදු පහකින් පසු බව?
- පොල් ගසක වඩාත් ඵල දායී තුරුණු විය වන්නේ වසර 30 සිට 50 දක්වා බව?
- පොල් ගසේ ඵලදාව අඩු වීම එතැන් සිට ඇරඹෙන බව?
- වසර 80 දී ඵලදායී ආයු කාලය අඩු වී යන බව?
- එසේනම් අද අප අනුභව කරන්නේත්, නොයෙකුත් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා යොදා ගන්නේත්, අප රෝපණය කළ පොල් නොව, අපගේ මුතුන් මිත්තන් වගා කල පොල්ගස්වල පලදාව බව?
- අපි අද ක්‍රියාත්මක වී එක් පොල්පැළයක් හෝ රෝපණය නොකළහොත් අපි අපේ දරුවන්ටත්, ඔවුන්ගේ දරුවන්ටත් අපගේ යුතුකම ඉෂ්ඨ නොකරන්නවුන් බව?
- අපි අද අදම ක්‍රියාත්මක නොවුණහොත්, ඔවුන්ට පරිභෝජනය කිරීමට පමණක් නොව දැකීමට හෝ පොල් ගසක් අනාගතයේදී නැති වන බව?
- ශ්‍රී ලාංකිකයින් සාමාන්‍යයෙන් ගුණ ගරුක, කෙළෙහි ගුණ අගය කරන්නා වූ ජාතියක් ලෙසින් පිළි ගැනීමක් ඇති බව?
- එසේනම් අපගේ මුතුන් මිත්තන්ගේ පලදාව භාවිතා කළ අපි ඔවුන්ට කෘතවේදීත්වය පල කිරීම සඳහාත්, අනාගත පරපුර උදෙසාත් අවම වශයෙන් එක් පොල් පැළයක් හෝ රෝපණය කළ යුතු නොවේද?

**තවත් පමා නොවන්න! අදම ක්‍රියාත්මක වන්න!**
**කප්රුක් වවන්නෝ දිනන්නෝය!!!**

# ඔබට කළ හැක්කේ කුමක්ද?



අපගේ රට අද මුහුණ පා ඇති ව්‍යසනකාරී අර්බුදයෙන් මුදවා ගැනීම සඳහා, වගකිවයුතු පුරවැසියෙකු ලෙසින් ඔබට කළ හැක්කේ කුමක්ද?

පළමු පියවර වන්නේ මනා අවබෝධයෙන් යුතුව ගැටළුව තේරුම් ගැනීමයි. පොල් මිල වැඩි වී ඇත්තේ සැපයුම අඩු වී ඇති නිසාවෙනි. සැපයුම අඩු වී ඇත්තේ නිෂ්පාදනය අඩු වී ඇති නිසාවෙනි. මෙය දාම ප්‍රතික්‍රියාවකි. පොල් වලින් ස්වයංපෝෂිත වීමට නම්, පොල් නිෂ්පාදනය වැඩි කිරීම අප විසින්
කළ යුතුයි.
මෙහිදී ඔබට බලගතු ගාමක ශක්තියක කොටසක් වීමට හැකිය!
ඔබගේ වත්තේ හෝ ගෙමිදුලේ හෝ පොල් පැළයක් රෝපණය කිරීමට අදම තීන්දුවක් ගන්න. ඔබට පොල් පැලයක් රෝපණය කිරීමට අවශ්‍ය ඉඩ ප්‍රමාණය නොමැත්තේ නම්, ඉඩක් කඩක් ඇති ඔබගේ ඥාතියෙකුට, මිතුරෙකුට, ඔබ සමග රැකියාවේ නියුතු සමකාලීනයෙකුට, අවම වශයෙන් එක් පොල් පැලයක් රෝපණය කිරීම සඳහා පරිත්‍යාග කරන්න. රෝපිත පැලය නඩත්තු කිරීම වෙනුවෙන් "good hands" ක්‍රියාන්විතය මගින් ගස රැක බලා ගැනීම ගැනත්, එහි වැඩීම ගැනත් ඔබට උපදෙස් ලබා දෙනු ඇත.

ඉතාමත්ම වැදගත් ස්ථාවරය වන්නේ හොඳ ආකල්පයක් සහ හොඳ ක්‍රියාවක් පමණි. අද අප විසින් පරිභෝජනය කරනු ලබන්නා වූ, පොල් ගස් රෝපණය කළ අපගේ මුතුන් මිත්තන්ට ණයකාරයෙක් නොවන්න!
අදම මතු පරම්පරාව උදෙසා පොල් පැල රෝපණය කරන්න!!



good hands
together for tomorrow

## VISION

- Fulfilling consumption needs in Sri Lanka.
- Earning Foreign exchange of vital importance.
- Resurgence of growing coconut plants as the counter measure for the rapid dwindling of coconut harvest in Sri Lanka.

## MISSION

- Encouraging Sri Lankans to grow at least one coconut plant in a suitable location and educating them as how to obtain coconut plants from a coconut.
- Disseminating relevant instructions and assisting the interested parties in growing coconut trees.
- Establishing a strong foundation to encourage people to grow coconut plants through coordination of relevant Government Departments, coconut growers and any other professionals in the field.

## good hands
# The concept

Regarded as the Kapruka or the Tree of Life, the coconut tree has been connected with Sri Lanka and its culinary culture for generations. This Kapruka which was spread all over the island in the past, is currently not grown in abundance as before.

In the recent past Sri Lanka's main export earnings were from tea, rubber and coconut, respectively. Whilst maintaining a well established export industry coconut also retained a strong domestic value as a customary, essential ingredient in preparation of Sri Lankan food. Until recent times coconut trees were commonly seen throughout the country in places such as home gardens, road sides and public areas of villages and towns as well as in coconut plantations. Thus, Sri Lankans relied mostly on the crop of their own gardens for day to day consumption.

However, this changed drastically during the past few decades when coconut trees gradually disappeared from residential lands. Also due to the demands of rapid urbanization, large scale coconut plantations were fragmented by different companies and persons with various business objectives. The supply of coconuts became inadequate to meet the demand for both domestic use and export oriented industries within a short period of time.

A grave negative impact on every aspect of the coconut industry and a further increase of coconut prices cannot be avoided if the decline in the coconut crop continues into the next decade. However, it is possible to prevent this if prompt action is taken now at this critical juncture.
A Positive plan of action will be to address the root-cause of the problem, the insufficiency of coconuts trees.



Sri Lanka's per capita coconut consumption is high as our conventional diet is heavily dependent on coconuts. Currently about 1.8 billion coconuts, which is approximately 70% of the annual crop, are utilised in households for food preparation. Recent studies have concluded that the yield of one coconut tree fulfils the annual need of one person.

**good hands** concept introduces the idea that planting and cultivating a minimum of one new tree per individual would yield a minimum of 1.8 billion additional more nuts per year nationally.

Whilst facilitating a considerable ease on household expenditure, this concept will create household food security which will in turn help to establish national food security. Furthermore, the approximately 1.8 billion currently grown coconuts saved up from domestic consumption through the **good hands** concept will subsequently be available for manufacturing of export oriented value added coconut kernel based products. This would bring in additional foreign income as a result, contributing to rapid economic development of the country.





good hands



# good hands
# The way forward

Let each individual grow at least one new coconut tree in any available location. This would result in a new cluster of coconut trees equivalent in number to the national population, which will in turn fulfil the total local household coconut requirement.

Own grown coconuts shall bring direct benefits through cost savings and ensure food security of the family leading to food security of the country. Moreover, every coconut acquired from each new coconut tree that is planted, replaces a currently grown coconut that could be used to manufacture export oriented coconut products. Thus each and every Sri Lankan who plants a new coconut tree becomes a contributor to earning foreign exchange for the country.

A simple act of good hands today will nourish the entire nation tomorrow.



# good hands
# Community Contribution

Encouragement and information will be provided to every Sri Lankan to plant at least one new coconut tree in any suitable location and to care for it at every stage from acquiring seeds/ seedlings to harvesting.

Constructive suggestions and advice for the progress of this national cause are sought from the citizens, industrial partners, coconut growers, government authorities and all other relevant parties in order to collectively achieve the ultimate goals.

# Did you know?

- A coconut tree fructifies generally after five years?
- The most matured, fruitful age is between 30 to 50?
- After that age deterioration sets in?
- Tree expires at the age of 80?
- We, then today, eat, utilize for various coconut based industries, the coconuts not planted by us but the harvest of the coconut trees planted by our forefathers?
- If we do not act today and grow at least one coconut tree, we do not fulfill our duty towards our children and children of theirs?
- If we do not act today and now, not only there will be no coconuts for their consumption but there will be no coconut tree for them to see?
- That there is universal acceptance as Sri Lankans are a grateful nation admiring quality of gratitude?
- Hence, should not we who used the coconuts planted by our ancestors grow at least one coconut plant to express them our gratitude as well as for future generation?
- Do not procrastinate anymore! Act today!!



**Winners are the growers of kapruk!**



# What can you do?

As a responsible citizen what can you do to circumvent the current precarious situation the country has faced with?

The first step is for you to consciously understand the current situation; the coconut prices are high due to supply is low; supply is low because production is low….. This is a chain reaction. If we are to be self-sufficient in coconuts, we must start to increase production.

Here you can be part of the dynamic force!

Decide today itself to plant at least one coconut tree in your garden, compound or any other vacant plot of land. If you do not have enough space, obtain at least one coconut plant and donate it to your friends, relatives and colleagues who have space available to grow a tree.

Maintain the tree… the **good hands** Initiative shall advise you as how to look after the tree and its growth.

The most important view point is to develop right attitude and right action!

Do not be a debtor to our ancestors, who grew coconuts for our present day consumption!

Grow coconut trees today for our future generation!



+94 11 3456 777
+94 77 1757 027

No. 56/2, Horton Place,
Colombo 07, Sri Lanka

goodhands.lk
info@goodhands.lk



good hands
*together for tomorrow*